# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 9 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 අප්‍රේල් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1978 අප්‍රේල් මස 12 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල: ශත 25 යි      තැපැල් ගාස්තුව: ශත 15 යි

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 9 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 අප්‍රේල් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 42/77

**1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 9 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනත, 1977 නොවැම්බර් මස 18 වන දින සිට හා ඉන් පසුව මේ පනත ආරම්භ වන දිනය තෙක් බලපවත්වා ඇතැයි ද බලපවත්වන්නේ යයි ද සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. 1970 අංක 28 දරන පනත නොකඩව බල පැවැත්වීම.

3. 1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 12 වන වගන්තියෙහි "අවුරුදු හතක" යන වචන වෙනුවට "අවුරුදු දහ තුනක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1970 අංක 28 දරන පනතේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. යම් ස්ථානයක කුලී නිවැසියා හෝ එහි පදිංචිව සිටින යම් තැනැත්තකු හෝ එයින් නෙරපනු ලැබ ඇති බව 1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා වෙත නිවේදනය කරනු ලැබූ විට, නිවේදනයේ දිනයෙහි හෝ නෙරපීම සිදු වී ඇතැයි කියනු ලබන දිනයෙහි හෝ ඉහත කී පනත බලනොපැවැත්වූ බව හේතුකොටගෙන කරන ලදැයි කියනු ලබන නෙරපීම සම්බන්ධයෙන් විභාග කිරීම ප්‍රතික්ෂේප කරමින් කොමසාරිස්වරයා විසින්, 1977 නොවැම්බර් මස 18 වන දින ආරම්භව මේ පනත ආරම්භ වන දිනයෙහි අවසන් වන්නාවූ කාලය තුළ, නියමයක් කර ඇති අවස්ථාවක, පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය:— වලංගු කිරීම.

(අ) එම නියමය ශූන්‍ය හා බලරහිත වී ඇතැයි ද එසේ වන්නේ යයි ද සලකනු ලැබිය යුතු ය ; තවද

(ආ) එම කාරණය අලුතෙන් භාර ගැනීමට, විභාග කිරීමට හා නිශ්චය කිරීමට කොමසාරිස්වරයාට මෙයින් බලය දී බලය පවරා, නියම කරනු ලබන අතර එසේ එම කාරණය අලුතෙන් භාර ගැනීමට, විභාග කිරීමට හා නිශ්චය කිරීමට අධිකරණ බලය ඔහුට ලැබිය යුතු ය.

මේ වගන්තියෙහි, "කොමසාරිස්වරයා" යන්නට 1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි දී ඇති අර්ථය ම ඇත්තේ ය.

2—ඒ 33456—11,608 (78/04)